# රන් නෙළුම හා හොඳ ළමයා



ඒ.ජී. සෙතුනි දහම්දි අගලවත්ත

කෘතියේ නම :- රන් නෙළුම හා හොඳ ළමයා

කතෘගේ නම :- සෙතුනි දහම්දි අගලවත්ත (6 ශ්‍රේණිය G)

කෘතියේ අයිතිය ඇතුළු විස්තර :- ISBN - 978-624-208-436-7

කෘතිය පල කරන දිනය :- 2025-02-08

# <u>පිදුම</u>

අප විද්‍යාලයේ විදුහල්පතිතුමිය වන

ශෂිකලා සේනාධීර ගුරු මෑණියන්ටත්

විද්‍යාලයේ

ගුරු මෑණිවරුන් සහ පියවරුන්ටත්,

මාගේ පවුලේ සියලු දෙනාටත්

මාගේ හදපිරි ගෞරවය පුද කර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතා කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක ඈත පිටිසර ගම්මානෙක දුප්පත් වෙළෙන්දෙක් හිටියා. එයාට මේරි සහ ෆේරි කියලා දුවලා දෙන්නෙක් හිටියා. ෆේරි තමා අක්කා, මේරි නංගී. ෆේරි ගොඩක් ලස්සනයි.

එනිසා ෆේරි තමාගේ නංගි වන මේරිව පවුලේ අයගෙන් ඈත් කරා. ඒත් මේරි ඒ ගැන දුක්වුනේ නෑ. එයා අක්කා තරම් ලස්සන නැති වුනත් එයා හරි කරුණාවන්තයි. මේරි හරියටම එයාගෙ අම්මා වගේ. එයාගේ අම්මත් හරිම කරුණාවන්තයි. එත් එයාගේ අම්මයි තාත්තයි ඒ දෙන්නට ම  ආදරෙයි.



එත් එක දවසක් අවසනාවන්ත විදිහට එයාලගේ අම්මා මිය ගියා. ඉතින් ඊට පස්සේ මේ ඔක්කොම දේවල් බලා ගන්න වුනේ එයාලගේ තාත්තට. ඉතින් ඒක නිසා එයාලගේ තාත්තට හොඳ කරන්න බැරි ලෙඩක් හැඳුනා. ඒක හොඳ කරන්න බැහැ කියලා වෛද්‍යවරු කිවුවා.

එයාලා මේ ගමේ හිටපු හොඳම වෛද්‍යවරයා ගෙදරට ගෙන්නුවා. එතුමා කිවුවා මේ ලෙඩෙ හොඳ කරන්න නම් ගෙදර එහා පැත්තේ කන්ද මුදුනේ තියෙන සිද්ධස්ථානයේ රන් නෙළුම් මලක් තියෙනවා ඒකෙන් ඕනම ලෙඩක් හොඳ කරන්න පුළුවන් කියලා මිනිස්සු අතර කටකතාවක් තියෙනවා කියලා.



හැබැයි ඒක ගන්න යන්න තියෙන පාර හරිම දුෂ්කරයි. කැඩිච්ච පාලම්, භයානක සත්තු ඉන්න කැලයක් මැදින් තමයි යන්න තියෙන්නේ. ඉතින් මෙයාලගේ තාත්තා මෙහෙම කිව්වා. මේක ගෙන කෙනාට තමා මගේ ව්‍යාපාර ඔක්කෝම භාර දෙන්නේ. ඉතින් අක්කා ෆේරි මෙහෙම හිතුවා "මම හැමෝටම කලින් යන්න ඕන. එතකොට තාත්තාගේ හැමදේම මට දැන්ම පිටත් වෙන්න ඕන"

"තාත්තේ ...... තාත්තේ ..... මම මේ දැන් ම යන්නම්" එයා එයාගේ බඩු ලෑස්තිකර ගත්තා දැන්ම පිටත් වෙන්න ඕන. ෆේරි එයාට පුළුවන් තරම් ඉක්මනට ගෙදරින් පිටත් වුණා.



ෆේරි ඉක්මනින් ම  අඩි තියතියා ගියා. එයා ඇවිඳගෙන ගිහින් අන්තිමට ම කැඩිච්ච පාලමක් හම්බ වුණා. ෆේරි මෙහෙම හිතුවා. 'මට මේ පාලමෙන් ගොඩවෙන්න බෑ, මගේ නංගි එනකල් මම ඉන්න ඕන. එයාට යන්න පුළුවන්ද කියලා බලමු. මට නම් දැන් හරිම මහන්සි. ෆේරි ගලක් උඩ වාඩි වුණා. ටික වෙලාවකින් එතනට මහළු මිනිසෙක් ආවා. ඒ මනුස්සයා ෆේරිගෙන් මෙහෙම ඇහුවා.

"අනේ ළමයෝ මම දවස් දෙක තුනකින්ම කාලා නැහැ ඔබ ළඟ කන්න මොනවා හරි තියෙනවාද? "

ෆේරි මෙහෙම කිව්වා " මම මට කන්න විතරයි ගෙනාවේ. ඒක ඔයාට දුන්නහම හරි යනවද ? " එවිට වයසක මිනිසා කිව්වා

"මම ඔයාට මේ පාලමෙන් එගොඩ වෙන්න උදවු කරන්නම් මට කන්න මොනවා හරි දෙන්න."



මේ මනුස්සයාටවත් යන්න බැරි එකේ මෙයා කොහොමද මාව අරන් යන්නේ මෙහෙම හිතුවේ ෆේරි එවිට මේරිත් මෙතනට ආවා ඉතිං මේ වයසක මිනිසා මේරිගෙනුත් කන්න මොනවා හරි තියෙනවාද කියලා ඇහුවා.

" මේ පාන් ගෙඩිය කන්න " කියලා මේරි කිව්වා. වයසක මිනිසා පාන් ගෙඩියා කාලා ඉවරවෙලා මේරිට මෙහෙම කිව්වා.

" මගේ අතින් අල්ලා ගන්න එත් මේරි මෙහෙම හිතුවා දෙන්නෙක්ට තියා එක්කෙනෙක්ටවත් මේ පාලමෙන් එගොඩවෙන්න බෑනේ. ඒත් මේරි ඒ වයසක මිනිසා කියපු විදිහට කලා. "ෆේරි මෙහෙම හිතුවා අනේ මන්දා මේරිට පිස්සුද දන්නේ නැහැ. ඒත් මේක සැබෑවක් ද? මේ පාලම අලුත් වුනේ කොහොම ද? මමත් දැන්ම යන්න ඕන" කියලා ෆේරි අඩිය තිබ්බා විතරයි පාලම පරණ වුණා.



මේරි වයසක මිනිසා සමග පාලමෙන් එගොඩ වුණා. ඊට පස්සේ මේරි මෙහෙම ඇහුවා. "ඔබ කොහොමද ඒක කළේ? ඒ විගසම මහළු මිනිසා එයාගේ නියම රූපයට ආවා. මේරි ඇහුවා "ඔයා කවුද " කියලා.

"මම තමයි මේ කන්දට අධිපති දෙවියෝ ඇයි ඔයා මෙහේ ආවේ දරුවෝ. "

මේරි කිව්වා "මාගේ තාත්තට හොඳ කරන්න බැරි ලෙඩක් හැදිලා ඒක හොඳ කරන්න බෙහෙතක් හොයාගෙන තමයි මම ආවේ."

" බොහොම හොඳයි "කන්දේ දෙවියෝ කිව්වා.

"මෙතන ඉදලා ගඟක් හම්බවෙනකල් යන්න ඊට පස්සේ මේ කොටි හමෙන් හදපු බෑග් එකට ඒ ගඟෙන් වතුර පුරවන්න. ඊට පස්සේ කන්දක් හම්බවෙනකල් යන්න. ඒ කන්ද පාමුල ගලෙන් හදපු බේසමක් ඇති. ඒක එතනින් එහාට කරන්න. ඕන දේ ඔයාට තේරෙයි "

එහෙම කියලා කන්දෙ දෙවියො අතුරුදහන් වුණා.



ඊට පස්සේ මේරි ගඟක් හමුවෙනතුරු ගියා ඇය කොට් හම් සහිත බෑගයට වතුර පුරවාගෙන කන්දක් හමුවෙනකල් ගියා. වන සත්තු කොට් හම් සහිත බෑගයට භය වුණා. ඒ නිසා මේරිට කිසිම කරදරයක් වුණේ නෑ. කන්දෙ දෙවියෝ කියපු විදිහට ම එයාට කන්දක් හමු වුණා.

ඒ කන්ද පහළ ගලින් හදපු බේසමක් තිබුණා. ඉතින් මේරි කොට් හමෙන් හදපු බෑගයේ තිබුණු වතුර ටික අර බේසමට දැම්මා. දැන් බේසම පිරෙනවාත් එක්ක කොට් හමෙන් හදපු බෑගය වතුර ඉවර වුණා. මේරිට හරි පුදුමයි.



එක පාරටම එතන ලොකු ගොරිල්ලෙක් ආවා. එයා මේරි දිහා බලාගෙන හිටියා. කිසිම කරදරයක් කරේ නෑ. එයා ගල් බේසමේ වතුර බිව්වා. ඊට පස්සේ මේරිව අතින් අරගෙන කරේ තියාගත්තා. ඇයව කන්ද උඩ තියෙන සිද්ධස්ථානයට ඇහැ පියාගෙන වේගයෙන් එක්කන් ගියා. මේරිට මේක අලුත් අත්දැකීමක් වුණා. ඉතින් එයාට හරිම පුදුමයි. මේරි වටපිට බැලුවා. ඈත පොකුණක් තිබුණා. එයා කවදාවත් මේ වගේ තැනක් දැකලා තිබුණේ නැහැ. කවුරුත් පෙන්න හිටියේ නැහැ. මේරිට බයත් හිතුණා. ඒත් එයා තාත්තා ගැන හිතද්දි මේක කරන්නම ඕන කියලා හිතුනා.  මේරි පොකුණ පැත්තට ගියා.



එතකොට කන්දෙ දෙවියෝ ආයෙමත් මතු වුණා. "ඒයි ළමයෝ ඔබට ඒ නෙළුම ඕන නම් නෙළුමෙන් අවසර ගන්න වෙනවා. නුඹ ඒ නෙළුම අල්ලපු ගමන් එය ඔබේ අරමුණ අඳුර ගන්නවා. "

මේරි පාවහන් ගලවලා මඩ වතුරට අඩිය තිබ්බා. වතුර සීතල වැඩි නිසා එයා කකුල ආපස්සට ගත්තා. 'මම හිතුවට වඩා මේ වතුර සීතලයිනේ ඒ වුනාට තාත්තා වෙනුවෙන් මම ඒ නෙළුම ගන්න ඕන.' මේරි හිතුවා. වතුරට පනින්න, වතුර ගල් ගැහෙන තරම් සීතලයි. ඇගේ උත්සාහය අත්හැරියේ නෑ. ඇයගේ උත්සාහය තේරිලා වගේ රන් නෙළුම තව තවත් දිළිසුනා. එයාට පුළුවන් වුනා නෙළුම අතින් අල්ලන්න. ඒක අල්ලන්න බැරි තරම් රස්නෙ වුනත් තාත්තා බේරා ගන්න තියෙන අධිෂ්ඨානය නිසා එයා එයාගේ උත්සාහය අත හැරියේ නෑ. කන්දෙ දෙවියෝ කිව්වා "මේ පොකුණෙන් ගන්න වතුර වලින් මේ බෙහෙත හදන්න" කියලා එකපාරම දෙවියෝ අතුරුදන් වුණා.



මේරි එහෙ බලලා මෙහෙ බලද්දි එයා හිටපු තැනම හිටියා. එයා දැක්කා ෆේරි එතනැට වෙලා ඉන්නවා. මේරි ෆේරිගෙන් ඇහුවා

"ඔයා මම එනකල් මෙතනට වෙලා හිටියේ" කියලා ඊට පස්සේ ෆේරි මෙහෙම කිව්වා

"මේ ඔයා මේරි ද? ඔයා මේ තරම් ලස්සන වුණේ කොහොම ද?, මට මේ නෙළුම ගන්න සීතල මඩවගුරකට බහින්න වුණා. " මේරි කිව්වා

කොහොමත් මම තමයි ලස්සනම ෆේරි හිතුවා. ඊට පස්සේ ෆේරි මෙහෙම කිව්වා


"කෝ ඔයා රන් නෙළුම ගත්තා ද?"

" ඔව් " මේරි රන් නෙළුම ෆේරිට පෙන්නුවා. දැන් කරුවලත් වැටිලා අපි අද රෑ මෙහෙම ඉඳලා හෙට උදේම ගෙදර යන්න පිටත් වෙමු. මේරි කිව්වා. මේරිට රෑ හදිස්සියේම ඇහැරුණා මේරි වටපිට බැලුවා ෆේරි පෙන්න හිටියේ නෑ. එයා බෑගය ඇරලා බැලුවා රන් නෙළුම තිබුණේ නැහැ. මේරිට භය හිතුනා.



මේරි මෙහෙම හිතුවා, ෆේරි රන් නෙළුම අරගෙන ගෙදර යන්න ඇති. එයා කොහොමද මඩ වගුරෙන් ගත්ත වතුර නැතිව බෙහෙත හදන්නේ, මේරිගේ හිතට ප්‍රශ්න කෝටියක් විතර ගලාගෙන ආවා. මම දැන්ම ගෙදර යන්න ඕන, නැත්නම් ලොකු විනාශයක් වෙයි. මේරිට හිතුනා.

මේරි පුළුවන් ඉක්මනින් ගෙදර ගියා. ෆේරි මෙහෙම හිතුවා, මේ බෙහෙත හදන්න මෙකෙන් එක පෙත්තක් ඇති ඉතිරි ටික විකුණලා මම සල්ලි ගන්නවා. දැන් මේරි එන්න කලින් වැහි වතුර එකතු කරලා බෙහෙත හදන්න ඕන. ෆේරි බෙහෙත හදන්න පටන් ගත්තා. මෙයා වැහි වතුර එකතු කරපු නිසා මලේ දිලිසෙන ගතිය නැති වුණා. ෆේරි තාත්තාට බෙහෙත දීලා මෙහෙම කිව්වා. තාත්තේ ඔන්න මම බෙහෙත හැඳුවා. ඔහු එය පානය කළා. ඊට පස්සේ ඔහුට තේරුනා. මේ ඔහුගේ අන්තිම කලේ කියලා තාත්තාගේ කොණ්ඩේ, තිබුන ටිකක් හැලිලා ගියා. මේ වෙලාවේ මේරි එතනට ආවා.



මේරි ඇවිල්ලා මඩ වගුරෙන් ගත්ත වලින් බෙහෙත හැදුවා. මලේ තිබුණු පාටත් එක්ක මේ බෙහෙත තවත් දිළසුනා. මේරි බෙහෙත බොන්න තාත්තාට උදවු කළා. තාත්තාගේ හැලුණු කොණ්ඩය ආපසු ආවා. ඔහු ෆේරි ගැන දුක් වුණා. එතකොට මේරි අද ඉදන් මගේ ඔක්කොම ව්‍යාපාර ඔයාට භාර දෙනවා. ෆේරි ඔයා ගොඩාක් ලොබයි, අහංකාරයි, ඒකයි. ඔයාට මේ ඔක්කොම දේවල් සිදුවුණේ, මම හිතනවා ඔයා අද ඉදන් හොඳ කෙනෙක් වෙයි කියලා. තමන්ගේ නංගි ළඟ තියෙන්නේ හොඳ ගති ගුණ හින්දා ෆේරි තමාගේ නංගිව අනුගමනය කළා. ෆේරි සහ මේරි එදා ඉදලා සහයෝගයෙන් වැඩ කළා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතා සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN - 978-624-208-436-7